Sinhalese | සිංහල

# සැබෑම උපකාරයක්.
# දැන්මම.



## ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව: ප්‍රජා සත්කාර වැඩසටහන

අපගේ ප්‍රජා සත්කාර වැඩසටහන හරහා ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව සඳහා අයදුම් කිරීමට සහන කාඩ්පත් හිමියන්ට දුරකථනයෙන් සහ පුද්ගලිකව සහාය ලබාගත හැකිය.

### ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව

බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව යනු අවශ්‍යතා ඇති වික්ටෝරියානුවන්ට ජීවන වියදම පියවා ගැනීමට සහ බලශක්ති බිල්පත් අඩු කිරීමට සැබෑ ලෙසින් උපකාරී වන ඩොලර් 100 ක ගෙවීමකි. සුදුසුකම් ලත් සහන කාඩ්පතක් ඇති වික්ටෝරියානු නිවැසියන්ට Victorian Energy Compare (වික්ටෝරියානු බලශක්ති සංසන්දනය) වෙබ් අඩවියට - compare.energy.vic.gov.au - පිවිසී මාර්ගගතව අයදුම් කිරීමට හෝ ප්‍රජා සත්කාර වැඩසටහන හරහා අයදුම් කිරීමට හැකිය.

### ප්‍රජා සත්කාර වැඩසටහන

ඩොලර් 100 ක ගෙවීමක් සඳහා අයදුම් කිරීමට සහාය අවශ්‍ය සහන කාඩ්පත් හිමියන්ට ප්‍රජා සත්කාර වැඩසටහන හරහා දුරකථනයෙන් හෝ පුද්ගලිකව සහාය ලබා ගත හැකිය.

සුදුසුකම් ලත් නිවැසියන්ට 1800 000 832 අමතා දුරකථනයෙන් සිය ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව සඳහා අයදුම් කළ හැකිය, එසේ නැත්නම් ඔවුන්ගේ ප්‍රදේශයේ සහභාගික ප්‍රජා සේවා හවුල්කරුවෙකු සමග සම්බන්ධ විය හැකිය.

### සුදුසුකම් ලැබීම සඳහා වන අවශ්‍යතා

සුදුසුකම් ලැබීමට, නිවැසියන්ට:

- මෑත කාලීන නේවාසික විදුලි බිල්පතක් තිබිය යුතුය
- පහත සඳහන් සහන කාඩ්පත්වලින් එකක් තිබිය යුතුය:
  - සෞඛ්‍ය සේවා කාඩ්පත
  - විශ්‍රාමික සහන කාඩ්පත
  - ප්‍රවීණයන්ගේ කටයුතු විශ්‍රාමික සහන කාඩ්පත
  - ප්‍රවීණයන්ගේ කටයුතු රන් කාඩ්පත.

එක් නිවසකට එක් ගෙවීමක් පමණක් ලබා ගත හැකිය.



**ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව සඳහා අයදුම් කිරීමට, compare.energy.vic.gov.au** වෙත පිවිසෙන්න, නැත්නම් ප්‍රජා සත්කාර වැඩසටහන හරහා දුරකථනයෙන් හෝ පුද්ගලිකව අයදුම් කරන්න.

VICTORIAN ENERGY COMPARE

VICTORIA State Government

# සැබෑම උපකාරයක්. දැන්මම.

## එය සිදු වන ආකාරය

1. ඔබ ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව සඳහා සුදුසුකම් ලබන්නේ දැයි පරීක්ෂා කරන්න.
2. පහත ලියකියවිලි සූදානම් කරගන්න:
   - මෑතකදී ලැබුණු විදුලි බිල්පතක පිටපතක්
   - සුදුසුකම් ලත් සහන කාඩ්පතක්
   - ඔබගේ රියදුරු බලපත්‍රය හෝ Medicare කාඩ්පත*

   ඔබගේ අනන්‍යතාවය සහ සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඔබට මෙම ලේඛනවලින් තොරතුරු සැපයීම අවශ්‍ය වනු ඇත.
3. දුරකථනයෙන් හෝ පෞද්ගලිකව අයදුම් කිරීමට මෙම පිටුවේ දක්වා ඇති ප්‍රජා සංවිධානවලින් එකක් අමතන්න.
4. ඔබගේ අයදුම්පත අනුමත වුවහොත්, අපි ඔබට ඩොලර් 100 ක් එවන්නෙමු.

### සුදුසුකම් ලත් සහන කාඩ්පත්




*ඉමිකාඩ් සහ ඔස්ට්‍රේලියානු වීසා ද පිළිගනු ලැබේ

## ඔබගේ $100 ගෙවීම සඳහා අයදුම් කිරීමට උදව් අවශ්‍යද?

### දුරකථන ඔස්සේ සහාය

Victorian Energy Compare උපකාරක සේවාව – 1800 000 832

Victorian Energy Compare උපකාරක සේවාව මගින් වික්ටෝරියානු ව්‍යාපාර සහ නිවැසියන් සඳහා හොඳම බලශක්ති ගනුදෙනුව සොයා ගැනීම සඳහා Victorian Energy Compare වෙබ් අඩවිය භාවිතා කිරීමට සහාය වේ. උපකාරක සේවාව මගින් සුදුසුකම් ලත් නිවැසියන් සඳහා දුරකථනයෙන් අයදුම් කිරීමට සෘජු සහාය ඇතුළුව ඩොලර් 100 ක බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රසාද දීමනාව පිළිබඳ තොරතුරු සහ උපදෙස් ද සපයයි.

### පුද්ගලිකව ලබා ගන්නා සහාය

Neighbourhood Houses Victoria - 1800 000 832 අමතා හෝ compare.energy.vic.gov.au/psb-outreach වෙත පිවිසීමෙන් ඔබට ආසන්න සහභාගික මධ්‍යස්ථානයක් සොයා ගන්න.

Neighbourhood Houses යනු කැපවූ ස්වේච්ඡා සේවකයින්ගෙන් සමන්විත ප්‍රාදේශීය ප්‍රජා පාදක සංවිධාන වන අතර, ඔවුන් සියලු වයස්වල, හැකියාවන් සහ පසුබිම්වල පුද්ගලයින් සඳහා සමාජීය, අධ්‍යාපනික, විනෝදාත්මක සහ සහායක ක්‍රියාකාරකම් රාශියක් ඉදිරිපත් කරයි.

## ඔබේ බලශක්ති බිල්පත් ගෙවීමේ ගැටලුවක් තිබේද?

බලශක්ති ආධාර වැඩසටහන යනු බලශක්ති බිල්පත් සඳහා මුදල් ඉතිරි කර ගැනීමට උපකාරී වන Anglicare Victoria සමග හවුල්කාරිත්වයෙන් ලබා දෙන නොමිලේ සැපයෙන දුරකථන සේවාවකි. මෙම වැඩසටහන අඩු ආදායම්ලාභී නිවැසියන්ට හෝ බලශක්ති බිල්පත් ගෙවීමේ ගැටලු ඇති අයට ලබා ගත හැකිය.

මෙම වැඩසටහන මගින් පහත සඳහන් දෑ සඳහා ඔබට උපකාර ලබා දිය හැකිය:

- සුදුසුකම් ලත් සහන සහ ප්‍රදාන සඳහා අයදුම් කිරීමට
- ඔබේ සිල්ලර වෙළෙන්දාගේ ආර්ථික දුෂ්කරතා වැඩසටහන් වෙත ප්‍රවේශ වීමට
- වඩා හොඳ බලශක්ති දීමනා සොයා ගැනීමට, සංසන්දනය කිරීමට සහ ඒවාට මාරු වීමට
- බලශක්ති බිල්පත් තේරුම් ගෙන බිල්පත් දෝෂ නිවැරදි කිරීමට
- නිවසේදී බලශක්තිය ඉතිරි කර ගැනීමට
- මූල්‍ය උපදේශනය වැනි සේවාවන් වෙත ප්‍රවේශ වීමට.



ඔබගේ බලශක්ති බිල්පත් සඳහා උදව් ලබා ගැනීමට, සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9:00 සිට ප.ව. 5 දක්වා (රජයේ නිවාඩු දින හැර) 1800 161 215 අමතන්න.

© වික්ටෝරියා ප්‍රාන්ත බලශක්ති, පරිසර සහ දේශගුණික ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව 2025 අගෝස්තු

**ISBN** 978-1-76176-524-7 **(Print)**
**ISBN** 978-1-76176-525-4 **(pdf/online/MS word)**

ඉංග්‍රීසි භාෂාව හැර අනෙකුත් භාෂාවලින් සහාය ලබා ගැනීමට, 131 450 අංකයෙන් පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවා (TIS) අමතන්න.

**හිමිකම් අත්හැරීම**
මෙම ප්‍රකාශනය ඔබට උපකාරී විය හැකි නමුත් වික්ටෝරියා ප්‍රාන්තය සහ එහි සේවකයින් මෙම ප්‍රකාශනය කිසිදු ආකාරයක දෝෂයකින් තොර බවට හෝ ඔබේ විශේෂිත අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම සුදුසු බවට සහතික කරන්නේ නැත. එම නිසා මෙම ප්‍රකාශනයේ ඇති ඕනෑම තොරතුරක් මත විශ්වාසය තැබීමෙන් ඇතිවිය හැකි ඕනෑම දෝෂයක්, අලාභයක් හෝ වෙනත් ප්‍රතිවිපාකයක් සඳහා සියලු වගකීම් ප්‍රතික්ෂේප කරයි.

VICTORIA State Government